"පුරවරයටනවජීවයක්"

**උඩපළාත ප්‍රාදේශීයසභාව**- දැල්පිටිය,අටබාගේ

பிரதேசத்திற்குபுதியஉயிரூட்டம்

**உடபலாதபிரதேச சபை**- தெல்பிட்டிய,அட்டபாகே

**A new life for the city**

UdapalathaPradesiyaSabha - Delpitiya, Atabage

සභාපති / தலைவர் / Chairman – 081-2354796

කාර්යාලය / அலுவலகம் / Office – 081-2352218

ෆැක්ස් / பெக்ஸ் / Fax – 081-2352218


මගේඅංකය / எனது இல. / My No.CPC/UPS/01/04

ඔබේඅංකය / உமது இல. / Your No.

දිනය / திக / Date – 2022.06.

ගරු සභාපතිතුමා / ගරු උප සභාපතිතුමා

ගරු මන්ත්‍රීතුමා / ගරු මන්ත්‍රීතුමිය

## <u>උඩපළාත ප්‍රාදේශීය සභාවේ</u>

## <u>ජූනි මස මහ සභා රැස්වීම -2022</u>

2022 ජූනි මස මහ සභා රැස්වීම 2022.06.23 වන දින පෙ.ව. 10.00 ට ප්‍රධාන කාර්යාලයේ සභා රැස්වීම් ශාලාවේදී පැවැත්වෙන බව මෙයින් නිවේදනය කරමි.

මෙම රැස්වීම සඳහා ඔබතුමාගේ /ඔබතුමියගේ පැමිණීම ගෞරවයෙන් අපේක්ෂා කරන අතර එදිනට අදාළ න්‍යාය පත්‍රය පහත දැක්වේ.

(1) **පසුගිය මහ සභා රැස්වීම් වාර්ථා සභා සම්මත කිරීම**

(2) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන-**

1. 2022.06.02 දින KDB/E/PS-UP/05/2021/783-iii දරණ මූල්‍ය ප්‍රකාශන විගණන වාර්තාව සහ 2022.05.23 දිනැති මූල්‍ය ප්‍රකාශන විගණන වාර්තාව සහ 2022.06.06 දිනැති මූල්‍ය ප්‍රකාශන විගණන වාර්තාව සම්බන්ධ නිවේදනය සභාගත කරන ලදි.

(3) **ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම-නැත**

(4) **යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න -නැත**

(5) **යථා පරිදි කල්දී ඇති යෝජනා**

(5).**1.**<u>**ගරු සභාපති ඩී.ජී.ගුණසේන මැතිතුමාගේ යෝජනා**</u>

5 (1.1)මාර්ග පළුදු කිරිමේ ගාස්තු පහත පරිදි සංශෝධනය කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

| | | |
|---|---|---|
| I. | පස් පාර දික් අඩි 1කට මිල | රු.75.00 |
| II. | තාර පාර දික් අඩි 1කට මිල | රු.1200.00 |
| III. | කොන්ක්‍රීට් පාර දික් අඩි 1කට මිල | රු.1200.00 |
| IV. | කාපට් පාර වර්ග අඩි 1කට මිල | රු.2400.00 |

5 (1.2)හපුගස්පිටිය අංක 1128 දරණ ග්‍රාම නිලධාරි වසමේ "ප්‍රතිභා ප්‍රජා මණ්ඩලය" ලියාපදිංචි කිරිම සදහා මහ සභා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

5 (1.3) කහවත්ත අංක 1144 දරණ"ගැමුණු ප්‍රජා මණ්ඩලය" ලියාපදිංචි කිරිම සදහා මහ සභා අනුමැතිය ලබාගැනී සුදුසු බවට මම යෝජනා කරමි.

5 (1.4) වර්තමාන පවතින තත්වය අනුව ක්ෂේත්‍ර රාජකාරි සදහා ගමන් වියදම් වෙනුවෙන් අධික වියදමක් දැරීමට සිදුවීම නිසා සංවර්ධන නිලධාරි ජී.ජී.අයි.පී.ධර්මසේන, සංවර්ධන නිලධාරි ආර්.එන්.පී.කේ. පහන්වලගේ, සංවර්ධන නිලධාරි බී.ඒ.ආර්.එල්.නන්දසේන, සංවර්ධන නිලධාරි එච්.ජී.ඩී.එම්.ජයවර්ධන යන නිලධාරින්ට ගමන් වියදම් ලබා දෙන මෙන් ඉල්ලා යොමු කර ඇති ලිපිය සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

5 (1.5) 2022 වර්ෂයේ අයවැය ලේඛනයෙන් ප්‍රජා සංවර්ධන වැඩසටහන් සදහා වෙන්කර ඇති රු.150,000.00 මුදලින් රු.100,000.00 වැය කර මුහුම් පාඨමාලා දෙකක් සහ රු.50,000.00 වැය කර රූපලාවන්‍ය පාඨමාලාවක් ආරම්භ කිරීම සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

5 (1.6) උඩපළාත ප්‍රාදේශීය සභාව වෙනුවෙන් මහනුවර අභියාචනා මහාධිකරණයේ විභාග වන නඩු අංක ප්‍රති 39/20 හා 27/20 දරණ නඩු සදහා 2022/06/06 සහ 2022/06/08 දිනයන්හි පෙනී සිටීම වෙනුවෙන් රු.17,500.00ක මුදලක් නීතිඥ ගාස්තු වශයෙන් යූ.ඒ.බෝගහපිටිය මහතාට ගෙවීම සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

5 (1.7) පුස්සැල්ලාව ආදාහනාගාරය ආශ්‍රිත සුසාන භූමියේ භස්මාවශේෂ තැන්පත් කර ස්මාරක ඉදිකිරිම සදහා දැනට අයකරන රු.2000.00 මුදල ප්‍රමාණවත් නොවන බැවින් සංශෝධනය කිරිම සහ උත්සව සදහා ගවයෙකු හා එළුවෙකු ඝාතනය කිරිමේ අවසරය සදහා අයකරන රු.2000.00ක මුදල සංශෝධනය කිරීම සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

5 (1.8) 2022 වර්ෂයේ අයවැය ලේඛනයෙන් පුස්තකාල වැඩසටහන් සදහා වෙන් කල මුදලින් රු.100,000.00 මුදලක් වැය කර දොළුව මහජන පුස්තකාලයේ කලායතනයක් ආරම්භ කිරීම සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

5 (1.9) ගෘහස්ථ ජල සැපයුම් කරාමයක් සදහා රු.300.00 මුදලක් සහ ව්‍යාපාරික ජල සැපයුම් කරාමයක් සදහා රු.400.00 මුදලක් ලෙස පෞද්ගලික වෙළදසැල් සහ නිවාස වලින් ජල ගාස්තු අයකිරීම සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

5 (1.10) ගම්පොල, පිහිල්ලදෙණිය, අංක 317/14, P.P ශාන්ත කුමාර යන අය විසින් සිදු කල ඇති අනවසර ඉදිකිරීම ඉවත් කිරීම සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

5 (1.11)අංක CPPF – 7352 දරණ කැබ්රථයේ අළුත්වැඩියාව යුනයිටඩ් මෝටර්ස් ආයතනය මඟින් මෙතෙක් සිදුකර නොමැති බැවින් ඉදිරි කටයුතු සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

5 (1.12)දෛනික පදනම මත පුස්තකාලයේ සේවයේ යොදවා ගන්නා ලද සේවිකාවන් දෙදෙනාගේ සේවය තවදුරටත් ලබාගැනීම සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**කර්මාන්ත යෝජනා**

**ගරු සභාපති ඩී.ජී.ගුණසේන මැතිතුමාගේ යෝජනා**

5 (2.1)විඩන්වත්ත මුත්තුමාරි අම්මන් කෝවිල අසලින් යන මාර්ගය කොන්ක්‍රීට් කර සකස් කිරීම සඳහා රු.500,000.00 සුදුසු බවට මම යොජනා කරමි.

**ගරු මංජුල දිසානායක මන්ත්‍රීතුමාගේ යෝජනා**

5 (2.2)සොගමාවත්ත පහළ කොටසේ වහුගපිටිය මුස්ලිම් පල්ලිය ඉදිරිපිට ඇති ඉඩම් කොටසේ ප්‍රජාශාලාවක් ඉදිකිරිම රු.550.000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

**සංශෝධන යෝජනා**

**ගරු රංජන් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ යෝජනා**

5 (2.3) යටිපියන්ගල සුමනසේන මහතාගේ නිවස අසල සිට වසන්ත මහතාගේ නිවස දක්වා ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරීම රු.150,000.00 කර්මාන්තය,

ගලත සුසාන භූමිය අසල සිට කවුල්පාන ගම මැද මාර්ගය ඩොසර් කිරීම රු.250,000.00 කර්මාන්තය සහ,

නයාපාන සුසාන භූමිය අසලින් නයාපාන ගම මැද මාර්ගය කොන්ක්‍රීට් කර ඇති කොටසේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම රු.150,000.00 කර්මාන්තය වෙනුවට සංශෝධන කර්මාන්තය ලෙස නෝනාමලේ ජනපදයේ පහළ කොටස ගම මැද මාර්ගයේ රංකෙත මහතාගේ නිවස අසළ කොන්ක්‍රීට් කර ඇති කොටසේ සිට ඉදිරියට දිවෙන මාර්ගය කොන්ක්‍රීට් කිරීම රු.550,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

**(6) කාරක සභා වාර්ථා ඉදිරිපත් කිරීම -**

1. 2022.05.24 වන දින පරිසර කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම
2. 2022.05.31 වන දින තාක්ෂණික සේවා කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම
3. 2022.05.31 වන දින නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම
4. 2022.06.21 වන දින ටෙන්ඩර් කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම

**(7) ආදායම් වියදම් වාර්ථා ඉදිරිපත් කිරීම -** 2022 මැයි මස ආදයම් වියදම් වාර්තාව හා ආදායම් ප්‍රගති වාර්තාව ඉදිරිපත් කිරිම.

**(8) වෙනත් -** නැත

**(9) ඉදිරි මහ සභා දිනය තීරණය කිරීම-**

**(10) මහ සභාව අවසන් කිරීම**

සභාපති

උඩපළාත ප්‍රාදේශීය සභාව